E-journal of Social Work 2017 1 (1): 34-45

5

# THE IMPACT OF FAMILY IN PRODUCING CHILD SEX LABORERS (based on Dondra Divisional Secretariat, Matara)

## ළමා ලිංගික ශ්‍රමිකයන් බිහිවීම සඳහා පවුල් ඒකකය මගින් සිදුවන බලපෑම (දෙව්නුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්)

**Keerthi Jayawardene**
*MA (Sociology) University of Colombo, BA (sp-Hons) (Sociology) University of Ruhuna. Research Officer, Social Development Policy, Research & Publications Division, National Institute of Social Development*

**Abstract:** Children are the most important generation in any society as they hold the future. How we treat the children today, will tell what kind of society we will have in the future. In order to be better and responsible citizens they need to have a better today and everyone is responsible for that. But it is very clear that this has not been happening in many countries and lots of cases are reported where children do not even enjoy their basic rights. Education, social protection and relaxing are much important to them. When a child becomes laborer S/he is deprived of their rights. The case becomes even worst if the child has become a sexual laborer. This in turn results in children losing the security and their education and prone to exploitation.

The present study aims to find out the impact of family on a child becoming a sex laborer. When the family fabric is destroyed, this matters on deciding child's future. When a child becomes a sexual laborer, they are unsecured by all means. In fact the family itself or relatives have been the causes of making children as sexual laborers. Victimized many children belong to age category of 10-18 and the brokers are someone whom very close to them (family or relatives). The study has proved that the probability of a child being subjected to sexual laborer is high if the family is broken. Therefore adequate arrangements for the care of the child should be made in order to protect them.

Dondra Divisional Secretariat have been selected as the study area of this research. The primary and secondary data have been gathered by using number of tools. The case study method, Questionnaires and observations are used as primary data collecting tools whereas the books, magazines and internet sources have been used as secondary data collecting tools.

**Key words:** Child Labour, Socialization, Child Sexual harassment, Broken Family, Child Right

**සංක්ෂේපය:** ළමා පරපුර කලාපයකට හෝ මහාද්වීපයකට පමණක් නොව මුළු මහත් ලෝකයටම තිබෙන වටිනාම සම්පතක් ලෙස හැඳින්විය හැකිය. එයට හේතුව ළමයා සමාජයක අනාගත සැලසුම් සකස්කරන පුද්ගලයෙක් බවට පත්වීමත් නිසාය. අධ්‍යාපනය, විවේකය, සමාජ රැකවරණය ආදී අවශ්‍යතා ළමයාට වඩා වැදගත් වේ. මෙකී අවශ්‍යතා ඉටුවීම තුළ ළමයකුට වඩාත් තෘප්තිමත්ව සිය ළමා කාලය ගත කිරීමට අවස්ථාව සැලසේ. නමුත් මෙකී ක්‍රියාදාමය බිඳ වැටෙන අවස්ථා ද ඇත. එවැනි එක් ක්‍රියාදාමයක් ලෙස ළමා ශ්‍රම භාවිතය හඳුන්වා දිය හැකිය. ළමයින්ට හිතකර නොවන ආකාරයට අහිතකර සේවා පරිසරය තුළ අණ කිරීම බල කිරිම යටතේ හෝ ළමයා මුල් කොට හෝ ළමයාට ළමා කාලය අහිමි කරමින් පෞරුෂය වර්ධනයට බාධා ඇති කරමින් ඔවුන්ගේ ශ්‍රමය යම් යම් වැඩ සඳහා යොදවා ගැනීම ළමා ශ්‍රමය වේ. ළමා ශ්‍රමය භාවිතය සඳහා ප්‍රධාන වශයෙන්ම පවුල් ඒකකයේ දායකත්වය මූලික බලපෑමක් සිදු කරන බව දැක්විය හැකිය. පවුල් ඒකකය තුළ පවතින විභේදනය හා සහසම්බන්ධතා රටාව බිදවැටීම මේ සඳහා ප්‍රබල බලපෑමක් සිදු කරනු බව පෙන්වා දිය හැකිය. විශේෂයෙන්ම මෙම අධ්‍යයනයේ දී ළමා ලිංගික ශ්‍රමිකයන් පිළිබඳ අවධානය යොමු කරන අතර ශ්‍රමය සපයන ආකාරය තුළින්ම ඔවුන් සමාජය තුළ ආන්තික කණ්ඩායමක් බවට පත් වී ඇත. පවුල් ඒකකය තුළ ආසන්න ඥාතීන්ගෙන්ම මෙම ළමුන් අතවරයට ලක් වී ඇති අතර පාසල් අධ්‍යාපනය මුළුනින්ම බිද වැටීමට ලක් වී ඇත. අවුරුදු 10-18 ත් අතර වයසේ පසුවන ළමුන් මෙවැනි ලිංගික ශ්‍රමිකයන් බවට පත් වී ඇතිබව අධ්‍යයනය තුළ අනාවරණය විය. ලිංගික ශ්‍රමය සපයන මෙම ළමුන්ගේ කාර්යයන් සඳහා තැරැව්කරුවන් සිටීමත් ඔවුන් පවුලේ ආසන්නතම ඥාතියකු වීමත් සුවිශේෂී වේ. ළමා ලිංගික ශ්‍රමිකයන් සම්බන්ධයෙන් සිදුකරන මෙම පර්යේෂණයේ දී අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස දෙව්නුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය යොදා ගන්නා ලදී. එසේම අධ්‍යයනය සඳහා දත්ත ඒකරාශී කිරීමට උපයෝගී කර ගත් මෙවලම් ද කිහිපයකි. ප්‍රාථමික දත්ත ඒකරාශී කිරීම සඳහා ප්‍රශ්නමාලා ක්‍රමය, සිද්ධි අධ්‍යයන ක්‍රමය හා සහභාගී නොවන නිරීක්ෂණ උපයෝගී කර ගැණුනි. ද්විතියික දත්ත ඒකරාශී කිරීමේ දී ළමා හිමිකම් ප්‍රඥප්තිය, ළමා ශ්‍රමය සම්බන්ධයෙන් ලිය වී ඇති පොත්පත්, සඟරා හා අන්තර්ජාල තොරතුරු උපයෝගී කර ගන්නා ලදී.

**ප්‍රමුඛ පද:** ළමා ශ්‍රමය, සමාජානුයෝජනය, ළමා ලිංගික හිංසනය, බිදුණු පවුල, ළමා අයිතිවාසිකම්

**පර්යේෂණ පසුබිම**

ළමයින්ට හිතකර නොවන ආකාරයට අහිතකර සේවා පරිසරයක් තුළ අණ කිරීම, බල කිරීම් යටතේ හෝ ළමයා මුල්කොට හෝ ඔවුන්ට ළමා කාලය අහිමි කරවමින් පෞරුෂ වර්ධනයට බාධා ඇති කරමින් ඔවුන්ගේ ශ්‍රමය යම් යම් වැඩ සඳහා යොදා ගැනීම ළමා ශ්‍රමය ලෙස සරල ව අර්ථ දැක්විය හැකි ය (Kannan, 2001:03). දියුණු කාර්මික රාජ්‍යයන් වන බ්‍රිතාන්‍ය, ඇමරිකාව සහ ජපානය වැනි රටවල කාර්මික විප්ලවය සමග ම මුල් අවධියෙහි බහුල වශයෙන් දරුවන් වැඩෙහි යෙදවීම එක් ප්‍රධාන සමාජ සංසිද්ධියක් විය. එයට හේතුව වූයේ කාර්මික විප්ලවය නිසා පැවති වැඩවසම් නිෂ්පාදන රටාව තුළ පැහැදිලි පරිවර්තනයක් සිදු වීමයි. ඒ අනුව මෙතෙක් නිෂ්පාදනයේ පැවති මූලික අරමුණ වන "යැපීම" ලාභය බවට පත් විය. එසේ ම නිෂ්පාදන සාධක අතර ප්‍රමුඛ තැන ප්‍රාග්ධනය දිනාගන්නා අතර එතෙක් නිෂ්පාදන ක්‍රියාවලියේ වැදගත් ම සාධකය වන ශ්‍රමයට පැවති වැදගත්කම යන්ත්‍ර සූත්‍ර හා තාක්ෂණික ඥානය වෙත ආරෝපණය වේ. මේ නිසා විකිණීම සඳහා ශ්‍රමය හැර වෙනත් කිසිවක් නොමැති කාර්මික ශ්‍රම බලකායක් නිර්මාණය විය. මේ නව සමාජ වෙනස්වීම් සමග නිෂ්පාදනය ප්‍රමුඛ අරමුණු වන ලාභය සඳහා විශාල තරගයක් පවතින වෙළඳපොල ආර්ථිකයක් ලොව බොහෝ රාජ්‍යයන් තුළ නිර්මාණය වේ. එකම අවශ්‍යතාවයක් සඳහා සමාජතීය භාණ්ඩ විවිධ වෙළඳ නාමයන් යටතේ වෙළඳපොල වෙත පැමිණීම මේ යටතේ සිදු විය.

ළමා ශ්‍රමය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව ඇතුළු ව ලෝක තත්ත්වය මෙවැනි ආකාර වන අතර ඒ තුළ ළමුන් ශාරීරික, මානසික පීඩාවන්ට ලක්කිරීම මෙන් ම අධ්‍යාපනයෙන් ඔවුන් ඈත්කර තැබීම වැනි තත්ත්වයන් උද්ගත වී ඇත. නමුදු මෙවැනි ආකාර වූ ඍණාත්මක සාධක සම්බන්ධව ම අවධානය යොමු කිරීමෙන් ම පමණක් ළමා ශ්‍රමයේ සමාජ දෘෂ්ටිය සම්බන්ධ ව කතා කළ නොහැකි වේ. මේ නිසා මෙහි ධනාත්මක බලපෑම පිළිබඳ ව ද අවධානය යොමු කළ යුතු වේ. අනුමත කළ නොහැකි වුවත් විශේෂයෙන් ම පවුල් ආර්ථිකය තුළ මූල්‍යමය අංශය ශක්තිමත් කිරීමට දෙමාපියන්ට නොහැකි වූ විට දරුවන්ට පවුලේ ආර්ථිකය කඩා නොවැටී පවත්වා ගෙන යාමට මෙමගින් බලපෑම් හෝ කාර්යභාරයන් සිදු කරනු ලැබේ. අනෙක් අතට භෞතිකමය අංශය සංවර්ධනය සඳහා ද මේ මගින් මනා පිටුබලයක් සපය යි. නිවාස ඉදිකර ගැනීම, සීට්ටු ක්‍රමයන්ට ළමුන් හුරුවීම, නිවසට අවශ්‍ය නවීන බඩු භාණ්ඩාදින් මිල දී ගැනීම, පෞද්ගලික ඉතිරිකිරීම් සඳහා නැඹුරුව වැඩි වීම යන කාරණා ශ්‍රමයේ ධනාත්මක කාරණා වේ.

**පර්යේෂණ ගැටලුව**

ශ්‍රී ලාංකේය ළමා ශ්‍රමිකයන්ගෙන් බහුතරයක් ග්‍රාමීය අංශයේ රැකියාවන්හි හෝ ඊට සමගාමී ක්‍රියාකාරම්වල නිරත වේ. ඒ අනුව ග්‍රාමීය අංශයේ ළමා ශ්‍රමිකයන් වෙළඳාම් හා ගෘහ කටයුතු වැනි අංශවල යෙදී සිටිති. මේ නිසා ම ඔවුන්ගේ අධ්‍යාපනයට සහ සෞඛ්‍ය තත්ත්වයට එය හානි කර ලෙස බලපානු ලබයි. කායික හා මානසික පීඩාවන්ට ලක් වූ විට ළමයින් සියදිවි හානි කරගන්නා තත්ත්වයක් ද වර්තමානයේ ශ්‍රී ලංකාවේ දැකිය හැකි ය. මෙසේ ශ්‍රම සූරාකෑමට පමණක් නොව විවිධ පීඩාවන්ට ද ලක්ව නිසි අධ්‍යාපනයක් නොමැතිව ඔවුන්ගේ පවුල් බැම්මෙන් ගොස් සදාකාලික වහලුන් බවට පත් ව ඇත. විවිධාකාර වූ වෘත්තීන්වල නිරත වෙමින් පවුල තුළ ආර්ථික සම්පාදකයා බවට ළමයා පත්වීම තුළ ඔවුන්ගේ දෛනික කාර්යන්වල දී වැඩිහිටියන් තත්ත්වයට ඔවුන් ආරෝපනය වීමක් මේ මගින් සිදු වේ. වෙනත් පුද්ගලයන්ගේ යටතේ සේවය කිරීමෙන්, තමාට ස්වාධීනව තම කාර්යයවල නිරත වීමක් තුළ ළමයින්ගේ වැඩවල ස්වභාවය හඳුනා ගත හැකි ය. විශේෂයෙන් ම දෙවිනුවර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය සංස්කෘතික වශයෙන් ලෝකය පුරා වැදගත්කමක් හිමි වීමත් තුළ ළමා ශ්‍රමිකයන්ගේ දෛනික කාර්යයන් ද එම අංග ලක්ෂණ අනුව ප්‍රතිනිෂ්පාදනය වීමක් දැක ගත හැකි ය. වෙරළබඩ කලාපයක් වීමත් බැතිමතුන්ගේ වන්දනාමානයට පාත්‍ර වූ විෂ්ණු දේවාලය කේන්ද්‍රගතවීමත් දෙවිනුවර දේවාලයේ අවට ගම්මානවල මිනිස් ක්‍රියාකාරකම් ද ඊට සමගාමීව ප්‍රතිනිෂ්පාදනය වී ඇත. මෙවන් පසුබිමක් මත ළමයාගේ ශ්‍රමයේ ක්‍රියාකාරීත්වය ද ඉහත කී භූගෝලීය හා සංස්කෘතික පසුබිම මත ගොඩනැගී තිබීම දැකිය හැකි ය. මෙවන් පසුබිමක් මත මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව ලෙස අප හඳුනාගන්නා ලද්දේ **ළමා ලිංගික ශ්‍රමිකයන් බිහිවීම සඳහා පවුල් ඒකකය විසින් සිදුකරන බලපෑම කෙසේ ද?**" යන්නයි.

විශේෂයෙන් ම ළමා ශ්‍රමිකයන්ගේ තත්ත්වය විශ්ලේෂණය කිරීමේ දී පෙනී යන මූලික ලක්ෂණයක් වන්නේ මොවුන් ඉතා දිගු කාලයක් තමන්ගේ ශ්‍රමය සමාජයට මුදා හරිනු ලබන බව යි. තම සේවා මුරය සඳහා හිමිදිරි උදෑසන ම පිටත්වන ළමා ශ්‍රමිකයන් ඉන්පසු නොනවත්වා තමාගේ ශ්‍රමය අදාළ අංශය වෙත දියත් කිරීමක් දැකගත හැකි ය.

**පර්යේෂණ අරමුණු**

1. පවුල් ඒකකයේ ස්වභාවය හා ළමා ලිංගික ශ්‍රම භාවිතය අතර ඇති සම්බන්ධතාව හඳුනා ගැනීම.
2. ළමා ලිංගික ශ්‍රමිකයන්ගේ සමාජ, ආර්ථික හා සංස්කෘතික පසුබිම හඳුනාගැනිම.
3. ළමා ලිංගික ශ්‍රමිකයන්ගේ අනාගත අපේක්ෂාවන් හඳුනාගැනීම.

**පර්යේෂණ ක්‍රමවේදය**

පර්යේෂණයේ අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස දෙවිනුවර දේවාලය සහ ඒ අවට ප්‍රදේශය තෝරා ගැනුනි. මෙම ප්‍රදේශය තෝරා ගැනීමට ප්‍රධාන හේතුවක් වූයේ විෂ්ණු දේවාලය කේන්ද්‍රය කරගනිමින් මෙම ළමා ලිංගික ශ්‍රමිකයන්ගේ ජීවන රටාව සංවිධානය වී පැවතීමයි. එනම් දේවාලයේ පිහිටීමත් ළමුන්ගේ ශ්‍රමය සැපයීමේ රැකියා අංශයත් අතර ඍජු සම්බන්ධතාවයක් පැවතුනි. දේවාලය ළමුන්ගේ එදිනෙදා ජීවනෝපාය පවත්වා ගෙන යාමට හා ළමුන්ගේ සමාජ, සංස්කෘතික ක්‍රියාකාරකම් රටාව සංවිධානය වීමට විශාල බලපෑමක් සිදු කර ඇත. මෙහි දී ගුණාත්මක ක්‍රමය සහ ප්‍රමාණාත්මක ක්‍රමය දත්ත රැස් කිරීමේ දී පාදක කොට ගෙන ඇත.

### නියැදිය තෝරා ගැනීම සහ නියැදීම

මෙම පර්යේෂණයේ දී නියැදිය ලෙස තෝරාගනු ලැබුවේ සසම්භාවී නියැදීමයි. සසම්භාවී නියැදි ක්‍රමය යටතේ ස්ථරායන නියැදි ක්‍රමය මෙහි දී උපයෝගී කර ගන්නා ලදී. මෙවැනි නියැදිකරණයක් කෙරෙහි මූලික අවධානය යොමු කරන ලද්දේ ස්ත්‍රී පුරුෂ, ජනවාර්ගිකත්වය, ආගම, රැකියා වර්ග අනුව එක් ස්ථරයක් සමානුපාතිකව තෝරා ගැනීමට පහසු වූ නිසා ය. එසේ ම මෙම ළමුන් අතර සහසම්බන්ධතා රටාවක් ගොඩනැගී තිබුනාසේ ම ළමුන් විශාල ප්‍රමාණයක් මත්කුඩු, ගංජා, මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වී සිටීම යන කාරණා ද සුවිශේෂී වේ. ස්ථරායන නියැදි ක්‍රමය යටතේ ස්ත්‍රී පුරුෂ යනුවෙන් ළමා ශ්‍රමිකයන් දෙකොට්ඨාසය ම නියෝජනය වන පරිදි තෝරා ගනු ලැබිණ. ඒ අනුව අධ්‍යයනය සඳහා ළමා ලිංගික ශ්‍රමිකයන් 20ක් අධ්‍යයනය සඳහා යොදාගනු ලැබීය. එමෙන් ම අප විසින් උපයෝගී කරගත් ස්ථාරයන නියැදි ක්‍රමයේ දී ළමා ලිංගික ශ්‍රමිකයින් තෝරා ගැනීමේදී ඔවුන්ගේ පවුල්වල ස්වභාවය, අධ්‍යාපන මට්ටම හා ආර්ථික පසුබිම යන විචල්‍යයන් කෙරෙහි මූලික අවධානය යොමු කරන ලදි.

### දත්ත රැස්කිරීමේ ශිල්පීය ක්‍රම හා දත්ත රැස්කිරීම

අධ්‍යයනයට අදාළ ප්‍රාථමික දත්ත එක්රැස් කිරීමේ දී ප්‍රත්‍යක්ෂ අධ්‍යයනය (Case Study), ප්‍රශ්නමාලා උපලේඛන (Interview Schedule) හා සහභාගී නොවන නිරීක්ෂණ (Non-Participapatary Observation)නිරීක්ෂණ ක්‍රමය උපයෝගී කර ගන්නා ලදී. ඒ යටතේ ප්‍රත්‍යයක අධ්‍යයන 03 ක් ළමා ලිංගික ළමුන් 20ක් සඳහා ප්‍රශ්නමාලා උපලේඛන (Interview Schedule) ලබාදෙන ලදී. මීට අමතරව සහභාගී නොවන නිරීක්ෂණ (Non - Participation Observation) ක්‍රමය ද උපයෝගී කර ගන්නා ලදී. එසේ ම ද්විතික දත්ත රැස්කිරිමේ දී අදාළ ගැටලුව සම්බන්ධව ලියවී ඇති පොත් පත්, සඟරා ළමා ලිංගික ශ්‍රම භාවිතය පිළිබඳ ලියවී ඇති පොත්පත් හා සඟරා භාවිතා කරන ලදී. විවිධ පර්යේෂකයන් කර ඇති පර්යේෂණ වාර්තා, පරිවාස හා ළමා ආරක්ෂණ දෙපාර්තමේන්තුවේ පාලන වාර්තා, සංඛ්‍යානමය වාර්තා (ජාත්‍යන්තර කම්කරු සංවිධාන වාර්තා, සම්පත් පැතිකඩ, ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තු වාර්තා සහ අන්තර්ජාලය) ඔස්සේ ලබාගත් ලිපිලේඛන මේ සඳහා පරිශීලනය කරන ලදි. මෙම අධ්‍යයනය සඳහා දත්ත විශ්ලේෂණය කිරීමට සංඛ්‍යාන ක්‍රමයන්

උපයෝගී කරගනු ලැබේ. ඒ අනුව එකතු කර ගත් ප්‍රාථමික දත්ත වගු, සටහන් සහ ප්‍රස්ථාර මඟින් ඉදිරිපත් කර විශ්ලේෂණය කරනු ලැබීය. ගුණාත්මක දත්ත විශ්ලේෂණය කිරීමේ දී ඒවාට අදාළ විධිමත් සමාජ විද්‍යාත්මක ක්‍රමයන් අනුගමනය කරන ලදී.

**අනාවරණයන්**

අධ්‍යනයට ලක් කරන ලද ළමා ලිංගික ශ්‍රමිකයන්ගේ වයස් ව්‍යුහය, ස්ත්‍රීපුරුෂභාවය, අධ්‍යාපන මට්ටම යන මූලික සාධක ළමා ශ්‍රම භාවිතයේ දී තීරණාත්මක වේ. ඒ මත පදනම් ව ළමා ශ්‍රමිකයන්ගේ ක්‍රියාකාරිත්වයේ මූලික ස්වභාවය හඳුනාගැනීමට හැකියාව ලැබේ.

**වගු අංක 1.1. ළමා ලිංගික ශ්‍රමිකයන්ගේ වයස් ව්‍යුහය (නියැදියට අනුව)**

| වයස් ව්‍යුහය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| 10-12 | 4 | 20 |
| 13-15 | 7 | 35 |
| 16-18 | 9 | 45 |
| **මුළු එකතුව** | 20 | 100 |


**ක්ෂේත්‍ර සමීක්ෂණය**, 2017

වගු අංක (1.1) ට අනුව තෝරාගත් ළමා ලිංගික ශ්‍රමිකයන්ගෙන් වැඩි ප්‍රමාණයක් එනම් සියයට 45%ක් (9) වයස අවුරුදු 16- 18ත් අතර වයසේ පසු වන පුද්ගලයන් බව අනාවරණය වේ. විශේෂයෙන් ම මෙම වයස් කාණ්ඩයේ ළමා ලිංගික ශ්‍රමිකයන් පිළිබඳව අවධානය යොමු කිරීමේ දී ඔවුන් ලිංගික ශ්‍රමය සපයන වැඩිහිටියන් හා සමානව තම ලිංගික ශ්‍රමය සැපයීම සුවිශේෂී කාරණයක් වේ. අධ්‍යන දත්ත පරීක්ෂා කර බලන කල්හි වයස අවුරුදු 13 - 15 අතර වයසේ පසු වූ ළමා ලිංගික ශ්‍රමිකයන් 35% (7) ක් අනාවරණය විය. එමෙන්ම අවුරුදු 10 - 12ත් අතර වයසේ පසු වූ ළමා ලිංගික ශ්‍රමිකයන් 20% (4) ක් අධ්‍යනය සඳහා භාජනය විය. මෙම වයස් කාණ්ඩයේ ළමා ලිංගික ශ්‍රමිකයන් පිළිබඳව අවධානය යොමු කිරීමේ දී පෙනීයන කාරණයක් නම් ළමාවිය තුළ දෙමාපිය රැකවරණය ලැබීමට පැවති අවස්ථා පවා අහිමි වී ඇති බව අනාවරණය විය. මේ නිසා ළමාවිය තුළ රැකවරණය නැමති කායික අවශ්‍යතාවය සංතර්පණය වී නොමැති බව විශ්ලේෂණය කළ හැකිය. එමෙන්ම ළමුන්ගේ වයස් කාණ්ඩයේ ස්වභාවය පිළිබඳව අවධානය යොමු කිරීමේ දී සෑම ළමා ලිංගික ශ්‍රමිකයකුටම අධ්‍යාපනය, පෝෂණය හා අනෙකුත් කායික අවශ්‍යතා සංතර්පණය නොවීම ළමයා තුළ විහීන පෞරුෂයක් නිර්මාණය වීමට ද බලපෑමක් සිදුකරන බව පෙන්වා දිය හැකිය.

## ස්ත්‍රීපුරුෂ සමාජභාවය (Gender)

අධ්‍යනය සඳහා භාජනය වූ ලිංගික ළමා ශ්‍රමිකයන් සිය ශ්‍රමය සැපයීමේ දී එය ස්ත්‍රීපුරුෂ ලෙස දෙපාර්ශවයෙන් ම වෙනසක් නොමැති ව ශ්‍රමය සැපයීම සිදු විය. ඒ අනුව ළමා ලිංගික ශ්‍රමිකයන්ගේ ස්ත්‍රීපුරුෂ සමාජභාවය පහත පරිදි දැක්විය හැකිය.


**ප්‍රස්තාර සටහන් අංක 1.1. ළමා ලිංගික ශ්‍රමිකයන්ගේ ස්ත්‍රීපුරුෂභාවය**




**ක්ෂේත්‍ර සමීක්ෂණය,** 2017

ප්‍රස්තාර සටහන් (අංක 1.1) අනුව පෙනි යන්නේ ළමා ලිංගික ශ්‍රමිකයන්ගෙන් බහුතරය පුරුෂයන් වී ඇති බවයි. ලිංගික ශ්‍රමය සපයන ළමුන්ගෙන් ස්ත්‍රීන් සංඛ්‍යාව 30%(6) ක් වී ඇත බව අධ්‍යයන දත්ත පරීක්ෂා කිරීමේ දී ගම්‍ය වේ. මෙම කාරණයන් අනුව පෙන්වා දිය හැක්කේ අධ්‍යයන ප්‍රදේශය තුළ ලිංගික ශ්‍රමය සපයන ළමුන්ගෙන් බහුතරය පුරුෂයන් වී ඇති බවයි. විශේෂයෙන් ම දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සංස්කෘතික වශයෙන් විවිධත්වයක් පැවතිමත් විදේශීය සංචාරකයන්ගේ සංක්‍රමණයන් සංඛ්‍යාව ඉහළ යාමත් මත පුරුෂ ලිංගික ශ්‍රමියන්ගේ සංඛ්‍යාව ඉහල යාමට හේතුවක් වී ඇතිබව අධ්‍යයනය තුළින් අනාවරණය විය.

**ප්‍රස්ථාර සටහන් අංක 1.2. අධ්‍යාපන මට්ටම හා ළමා ලිංගික ශ්‍රම භාවිතය**




**ක්ෂේත්‍ර සමීක්ෂණය,** 2017

ප්‍රස්තාර සටහන් (අංක 1.2) ට අනුව ළමුන්ගේ අධ්‍යාපන මට්ටම ඉතා පහල අගයක් ගෙන ඇති බව පෙනේ. අධ්‍යයන දත්ත පරීක්ෂා කිරීමේ දී ළමා ලිංගික ශ්‍රමිකයන්ගෙන් බහුතරය ප්‍රාථමික අධ්‍යාපනය පමනක් ලබා ඇතිබව අනාවරනය වේ. එසේම කිසිදු අධ්‍යාපනයක් නොලත් සංඛ්‍යාව(9) ඉහල අගයක් නිරූපණය වීම තුළ ළමයාගේ මූලික අයිතිවාසිකමක් වන අධ්‍යාපනය ලැබීමේ අයිතිය අහිමි වී ඇත. මෙය ළමයෙක්ට ඔහුගේ අනාගත සාධිත තත්ත්වය ගොඩනගා ගැනිමට බාධාවක් වී ඇති බව විශ්ලේෂණය කල හැකිය. එමෙන්ම අධ්‍යාපනයක් නොලැබීම තුළ අනාගත ජීවිතය ගොඩනගා ගැනීමේ ගැටලුකාරී තත්ත්වයක් මතුවිය හැකි බවද නිගමනය කළ හැකිය. එමෙන්ම 1 ශ්‍රේණිය දක්වා

අධ්‍යාපනය ලබා ඇති ළමා ලිංගික ශ්‍රමිකයන් සංඛ්‍යාව 05(25%) ක් වී ඇත. 5 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලබා ඇති සංඛ්‍යාව 20%(4) වී ඇති බව අධ්‍යයන දත්ත පරීක්ෂා කිරීමේ දී පෙනී යයි. මෙම කාරණා පිළිබඳව අවධානය යොමු කිරීමේ දී පෙන්වා දිය හැක්කේ ළමුන්ගේ අධ්‍යාපන මට්ටම ඉතා පහළ අගයක් වන බවයි. විශේෂයෙන් ම ප්‍රාථමික අධ්‍යාපනය ලබාගැනීමට පමණක් මෙම ළමුන් යොමු වී ඇතිබව වගු සටහන පරීක්ෂා කිරීමේ දී පැහැදිළි කළ හැකිය. 9 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලබා ඇති ළමා ලිංගික ශ්‍රමිකයන් සංඛ්‍යාව (2) වී ඇති අතර එය මුළු නියැදියට 10%ක් වේ.

**වගු අංක 1.4. පවුල්වල ස්වභාවය හා ළමා ලිංගික ශ්‍රම භාවිතය**

| පවුලේ ස්වභාවය | ළමුන් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| දෙමාපියන් දෙදෙනාම අහිමි | 6 | 30 |
| මව පමණක් ජීවත්වන | 8 | 40 |
| පියා පමණක් ජීවත්වන | 3 | 15 |
| පියා නිවැරදිව නොදත් | 3 | 15 |
| **මුළු එකතුව** | **20** | **100** |

**ක්ෂේත්‍ර සමීක්ෂණය,** 2017

අධ්‍යයන දත්ත පරීක්ෂා කිරීමේ දී පෙනීයන කාරණයක් වන්නේ ළමා ලිංගික ශ්‍රමිකයන් බහුතරයක් ඒක මාපිය පවුල් හා දෙමාපිය රැකවරණය අහිමි වූ පවුල් තුළින් නිර්මාණය වී ඇති බවයි. විශේෂයෙන්ම කාන්තා ගෘහමූලික පවුල් තුළින් ළමා ලිංගික ශ්‍රමිකයන් බිහිවීමේ ප්‍රවනතාවය ඉහළ ගොස් ඇතිබව අධ්‍යයන දත්ත පරීක්ෂා කිරීමේ දී පෙනී යයි. එය මුළු නියැදියට ප්‍රතිශතයක් ලෙස 40%(8)ක් වේ. එමෙන්ම දෙමාපියන් දෙදෙනාම අහිමි වූ ලිංගික ළමා ශ්‍රමිකයන් 6(30%) ක් වූ අතර ඔවුන් පවුලේ වෙනත් වැඩිහිටි රැකවරණයේ ජීවත් වේ. පවුලේ වෙනත් ඥාතියකුගේ නිවසේ ජීවත් වන මොවුන්ට ළමා කාලය තුළ ලැබිය යුතු රැකවරණය නිසි ලෙස නොලැබී ඇති බව අධ්‍යයන දත්ත අනාවරණය කරයි. එසේම ඒක පිය පවුල්වල ජීවත්වන ළමා ශ්‍රමිකයන් 3ක් අධ්‍යයනය තුළ අනාවරණය වූ අතර ඔවුන්ට පවුල තුළ පියාගෙන් ඉටුවිය යුතු නිසි රැකවරණය නොලැබුණු බව අනාවරණය විය. එසේම මවගේ අනියම් ඇසුර නිසා පියා නිවැරදි ලෙස හඳුනා නොගත් ළමා ලිංගික ශ්‍රමිකයන් 3 (15%)ක් අධ්‍යනය තුළින් අනාවරණය කරගත හැකිවිය. මෙම ළමුන්ට මවගේ රැකවරණය නිසි ලෙස හිමි නොවන බවත් මවගේ තාඩන පීඩන නිසා ඔවුන් ලිංගික ශ්‍රමිකයන් බවට පත් වූ බව අධ්‍යයන තොරතුරු අනාවරණය කරයි. මෙම සියලුම කාරණා පරීක්ෂා කිරීමේ දී බිඳුණු පවුල් (Broken Families) පරිසරය ළමයෙක් ලිංගික ශ්‍රමිකයෙක් බවට පත් කිරීම සඳහා හේතු වී ඇතිබව පැහැදිළි කළ හැකිය. විශේෂයෙන්ම දෙමාපිය රැකවරණය ළමයෙක්ගේ පෞරුෂය සංවර්ධනය සඳහා මඟපෙන්වීමක් සිදුකරන අතර එය ළමයෙක්ගේ අනාගත සාධිත තත්ත්වය නිර්මාණය කිරීමට ද හේතුවක් වේ. එහෙත් දෙමාපිය රැකවරණය මෙම ළමා ලිංගික ශ්‍රමිකයන්ට අහිමි වීම නිසා ඔවුන්ගේ සාධිත තත්ත්වය නිර්මාණය කර ගැනීමේ ගැටලුකාරීත්වයක් මතුවේ.

## ළමා ලිංගික ශ්‍රමිකයන්ගේ බාහිර ස්වරූපය හා පරිසරය

දෙවිනුවර පවතින ඓතිහාසික පසුබිම සංචාරකයන්ගේ සිත් ඇද ගන්නා ස්ථානයක් බවට වර්තමානයේ පවත්ව ඇත. ලංකාවේ විශාල ම ප්‍රදීපාගාරය දෙවිනුවර පිහිටා තිබීමත්, සිංහාසන පාරේ පවතින ඓතිහාසික විෂ්ණු දේවාලය පැවතීමත් මත සංචාරකයන් විශාල සංඛ්‍යාවක් දෙවිනුවර ප්‍රදේශයේ සංචාරය කරති. ඒ තත්ත්වය මත සංචාරකයන්ගේ ලිංගික අවශ්‍යතා ඉටු කිරීමට ළමා ලිංගික වෘත්තිකයෝ සෑම විට ම කටයුතු කරති. මෙහි විශේෂත්වය නම් ගැහැණු හා පිරිමි ළමුන් දෙපිරිස ම මෙම කාර්යයේ නිරත වීම යි. ළමුන්ට මේ සඳහා පිටරටවලින් ගෙනෙන සෙල්ලම් බඩු, ඇඳුම් වර්ග හා විවිධ ටොෆි, චොක්ලට් ආදිය සංචාරකයන්ගෙන් ලැබේ. මෙම ළමුන් සංචාරකයන්

සමග සම්බන්ධතා පවත්වා ගැනීම සඳහා විවිධ උපක්‍රම අනුගමනය කර ගනී. සංචාරකයන් සමග ක්‍රීඩා කිරීමට ආරාධනා කිරීම, ඉංග්‍රීසි භාෂාවෙන් කුඩා ගීත ගායනය, ලෙංගතු සිනහව හා ලිංගික අවයව සංචාරකයන්ට පෙනෙන ලෙස ඇඳුම් ඇඳීම විශේෂ වේ. විශේෂයෙන් ම මෙවැනි ළමුන් තද නිල් හා කළු පැහැති ඇදුම් ඇඳීමට ප්‍රියතාවයක් දක්වා ඇත.

කලින් සඳහන් කල පරිදි මෙම ළමා ලිංගික වෘත්තිකයන් සංචාරකයන් සමග කුළුපග සම්බන්ධතා පවත්වමින් ඔවුන් සමග මිතුරු වී දෙවිනුවර වැල්ල තුළ ම සාදා ඇති කුඩා ලී නිවාසවල ලිංගික සංවාසයේ යෙදීම සිදු වේ. මෙම ලැලි නිවාසවලට අමතර ව දෙවිනුවර පවතින විශේෂ සංචාරක හෝටල් කාමර තුළ ද ලිංගික සේවය සැපයීම සිදු වේ. මෙහි ඇති විශේෂත්වය නම් හෝටල් ව්‍යාපාරිකයන් මෙවැනි ළමුන් සමග පැමිණෙන සංචාරකයන් සඳහා විශේෂ කාමර වෙන් කිරීමත් සිදු කර ඇත. එය "Baby Mini Room" ලෙස හඳුන්වයි. එම හෝටල් කාමරවල සිටින ඉහළ ශ්‍රේණියේ සිට පහළ ශ්‍රේණි දක්වා වූ සේවකයින් මෙවැනි ළමුන් හඳුනන අතර ඔවුන් හෝටලයට එන විට ම මෙවැනි Baby Mini Room ලබා දීමට කටයුතු කරති. සංචාරකයින්ට අමතර ව දේශීය පුද්ගලයින් ද මෙම ළමුන් සමග ලිංගික කාර්යේ යෙදෙන අවස්ථා ඇත. ඒ සඳහා එම ළමුන්ට රුː 500.00 ක මුදලක් ලැබේ. මීට අමතර ව ලිංගික වෘත්තියේ නියැලි ළමුන්ගේ පවතින තවත් සුවිශේෂීතාවයක් වන්නේ පිරිමි ළමුන් දකුණු අතෙහි ඉහළ ප්‍රදේශයේ ''නෙළුම් මල්'' හැඩති පච්ච විශේෂයක් කොටා ඇත. එම අතෙහි ඉහළින් S.B. යැයි කොටා ඇත. මින් අදහස් වන්නේ ''සත්‍ය ප්‍රේම බෘංගරාජයා'' යන්නයි. ගැහැණු ළමුන්ගේ වම් අතෙහි ඉහළ ප්‍රදේශයේ මෙවැනි නෙළුම් මල් හැඩති පච්ච කොටා ඇත. එය ළමා ලිංගික වෘත්තිකයන් හඳුනා ගැනීමේ විශේෂ සංකේතයක් වේ.

## ළමා ලිංගික ශ්‍රමය හා පවුල් ඒකකය අතර සහසම්බන්ධතාවය

අධ්‍යයන දත්තයන්ට අනුව පවුල් ඒකකයේ ස්වභාවය හා ළමා ලිංගික ශ්‍රමය අතර සෘජු සම්බන්ධතාවයක් පවතින බව පහත සඳහන් ප්‍රත්‍යෙයක අධ්‍යයනය පරික්ෂා කිරීමේ දී අනාවරණය වේ.

ජයරාණි, වයස අවුරුදු 13, වයසැති ළමා ලිංගික ශ්‍රමිකයෙකි. ඇයගේ ජීවිත කතාව ඇය සඳහන් කරන ආකාරයට පහත පරිදි වේ.

**ප්‍රත්‍යෙයක අධ්‍යයන අංක 01**

*මගේ ගම දෙවුන්දර කිරලවැල්ල. මගේ මුල් පදිංචිය ගන්දර. මම දෙවුන්දරට ආවේ අම්මා නැතිවුණාට පස්සේ. අපේ අම්මා සුනාමියට අහු වෙලා මැරුණා. මමයි තාත්තයි මල්ලිලා තුන්දෙනයි බේරුණා. පස්සේ අපි දෙවුන්දර කිරලවැල්ලේ පදිංචියට ආවා. තාත්තා කළේ මුහුදු රස්සාව. තාත්තා කිරලවැල්ලට ආවට පස්සේ තවත් නැන්ද කෙනෙක් කසාද බැන්දා. ඒ නැන්දා හරිම සැරයි. අපිට ආදරේ නෑ. දවල්ට ඉස්කෝලේ ඇරිලා ආවහම කන්න දෙන්නෙත් නැහැ හරියට. කන්න වැඩිපුර ඉල්ලුවොත් වේවැලෙන් ගහනවා. අපේ මල්ලිලා තුන්දෙනාගෙන් දෙන්නයි ඉස්කෝලේ යන්නේ. අනෙක් මල්ලි ඉස්කෝලේ යන්නේ නෑ. එයාට වයස 07 යි. එයා යනවා තව ආච්චි කෙනෙක් එක්ක පොඩි සල්ලි බිස්නස් කරන්න. පොඩි සමහර දවස්වලට තාත්තා මුහුදු ගිහින් ආවට පස්සෙ මල්ලිලාට චීස්, චොක්ලට්, සෙල්ලම් බඩු ගෙනත් දෙනවා. අපිට දෙන්නේ නෑ. මම තාත්තට කිව්වා අපිටත් ඒවා ගෙනත් දෙන්නෙයි කියලා. තාත්තා මට කණට එකක් ගහලා කිව්වා උඹලට ඕනනම් හම්බ කර ගෙන කාපල්ලා කියලා කිව්වා. මට හරිම දුකයි. මම එදා දවසෙ ම අඬ අඬා හිටියා. කෑවෙත් නෑ. දවසක් මම ඉස්කෝලේ ගිහිල්ලා ඇවිල්ලා පාඩම් කර කර ඉන්න කොට නැන්දා හදිසියේ ම මට කුස්සියට කතා කලා. මම වැරැද්දට පවා නැන්දා අපිට ගහනවා. නැන්දටත් මල්ලිලා දෙන්නෙක් ඉන්නවා. එයාලට තාත්තයි නැන්දයි ආදරෙයි. හොඳට කන්න දෙනවා.*

ඉහත ප්‍රත්‍යෙක අධ්‍යයනය පරීක්ෂා කර බලන කල්හි පෙනීයන මූලික කාරණා කිහිපයක් වේ. එනම් පවුල් ඒකකය තුළ ළමයාට දෙයාකාරයකින් සැලකීමට ලක් වී ඇති බවයි. මේ නිසා එක ම පවුල තුළ දරුවන්ගේ රැකවරණයේ දී හා සෙනෙහසේ දී ස්ථරායනයක් නිර්මාණය වී ඇති බව පෙනේ. මුල් පවුල් ඒකකයේ මවගේ සමුගැන්ම දෙවන පවුල් ඒකකයට ප්‍රවේශ වන මුල් දරුවන්ට දෙවන මවගේ ආගමනය වඩාත් බරපතල ආකාරයට බලපා ඇත. එමනිසා මෙම ප්‍රත්‍යෙක අධ්‍යයනයේ දී

පවුල් සංස්ථාවන් අතර වන සංක්‍රාන්තික අවධිය ඉහත ළමයා ලිංගික ශ්‍රමිකයෙකු බවට පත්වීමට බලපා ඇති බව පෙනේ.

එමෙන්ම තවදුරටත් උක්ත ප්‍රත්‍යෙක අධ්‍යයනයට අදාළ ළමා ලිංගික ශ්‍රමිකයාගේ ක්‍රියාකාරීත්වය මෙලෙස පැහැදිළි කළ හැකිය.

**ප්‍රත්‍යෙයක අධ්‍යයන අංක 02**

*මම නැවතිලා ඉන්නේ අපේ ගෙවල් කිට්ටුව නැන්දකෙනෙක්ගේ ගෙදර. ඒ ගෙදර මාමා හැම තිස්සේම මගේ අත අතගානවා. ඔළුව අත ගානවා. මගේ පස්ස පැත්ත මිරිකනවා. මම හිතුවේ ආදරෙට කියලා. මම ඒක නිසා ඒවා ගණන් ගත්තේ නැහැ. එක දවසක් නැන්දයි මායි නැගිටින කොට උදේ 6.30 විතර වෙලා. නැන්දා මට කිව්වා අද කඩේට පරක්කු වෙලා එන්න කියලා. උදේට උයලා මාමටත් දීලා කන්න කිව්වා. පස්සේ මම එදා දවසේ ගෙදර ඉඳගෙන ඉව්වා. මම උයලා ඉවර වෙලා මාමාට කතා කලා කන්න. මාමා හා කියලා කිව්වා. ඊට ඉස්සෙල්ලා පොඩි වැඩක් කරන්න තියෙනවා කිව්වා. මාමා මට පස්සේ කතා කලා කාමරේට. මම ඉතිං බය නැතිව ගියා. පස්සේ මාමා කිව්වා මාමයි ළඟින් වාඩිවෙන්න කියලා. මම වාඩි වුණා. පස්සේ මාමා පාට පාට කුණුහරුප පත්තරවල පින්තූර වගයක් පෙන්නුවා. මම බයවුණා. මම කාමරෙන් දුවන්න හදනකොට මාමා මාව අල්ල ගත්තා. මාමා කාමරේ දොර වහගත්තා. මම කාමරේ ඇතුලෙත් දිව්වා. පස්සේ මාමා මාව වඩාගෙන ඇඳ උඩට දැම්මා. මගේ ඇඳුම් ඔක්කොම ගැලෙව්වා. මාමත් සරම ගලවලා දාලා මාව හයියෙන් බදාගෙන ඉම්බා. මගේ ඇඟ හැමතැන ම ඉම්බා. පස්සේ මගේ පපුව හොඳට ම මිරිකුවා. මූණත් හැපුවා. ඊට පස්සේ අයියේ මගේ ජීවිතේ නැතිකලා. මට මාමා හොඳට ම වද දුන්නා. මාමා මට කරපු දේවල්වල දී මට පුදුම තරම් රිදුනා. මාමා මොනව ද කලා තමයි. මට ඒක කලේ මම රිදෙනවයි කිව්වමත් මාමා ගණන් ගත්තේ නෑ. එද දවසෙ ම මාමා මට මේ විදියට කරදර කලා. මගේ ජීවිතේ සදහට ම නැතිවුණා වගේ. දැන් මම මාමාගේ යාළුවොත් එක්ක නොයෙක් ලිංගික කටයුතුවල යෙදෙනවා. ඒකට මට රු. 200-300 වගේ ලැබෙනවා. ඒකෙන් තමයි මම මගේ පවුල නඩත්තු කරන්නේ.*

ළමා ලිංගික ශ්‍රමිකයකු ලෙස කටයුතු කරන මෙම කාන්තා ළමා ලිංගික ශ්‍රමිකයා ලිංගික අපයෝජනයට ලක්වීමට ප්‍රධාන හේතු කාරණා කිහිපයක් බලපා ඇත. විශේෂයෙන් ම පවුල තුළ පවතින මූලික අනාරක්ෂිතභාවය ඇතිවීම නිසා ළමයාගේ ළමාවිය අහිමි වීමක් සිදු වී ඇත. මෙම අනාරක්ෂිතභාවය ළමයා පවුල තුළ හිංසනයට ලක් වී ඇති බව පෙනේ. ළමා හිංසනය පවුල් ඒකකයෙන් ම සිදු වීම මත ළමයාගේ රැකවරණය හා පෝෂණය පිළිබඳ ව ගැටලුකාරී තත්ත්වයන් මතු වී ඇත. විශේෂයෙන් ම ළමා කාලය තුළ තම දෙමාපියන්ගෙන් ලැබිය යුතු චිත්තවේගීමය පෝෂණය හා සමාජානුයෝජනය බිඳවැටීම මත ළමයාගේ සාධිත තත්ත්වය නිර්මාණය කර ගැනීමේ ගැටලුකාරී තත්ත්වයන් ඉස්මතු වී ඇතිබව පෙනේ. එක් අතකින් ඇය කුඩම්මා තුළින් චිත්තවේගීමය හා කායිකව අපයෝජනය වීමත් අනෙක් අතින් සිය අසල්වැසියකුගෙන් ලිංගික අපයෝජනයට ලක්වීමත් මත පවුල් තුළ දරුවන් සම්බන්ධ ව පවතින අනාරක්ෂිතභාවය වඩාත් ඉස්මතු වී තිබේ. අනෙක් අතට ළමයාගේ දෙවන පවුල් පරිසරය තුළ ඇය එක්තරා ලෙසකට බහුවිධ කාර්යයන් ඉටු කරන ශ්‍රමිකයකු බවට පත් වී ඇත. ලිංගික අපයෝජනය තුළ දී ද එය ලිංගික අපයෝජනයේ ආකාර දෙකෙන් ම අපයෝජනයට ලක් වී ඇති බව පෙනේ. විශේෂයෙන් ම කුඩා කාලය තුළ දී මෙවැනි ආකාරයේ ලිංගිකමය විකෘතිතා මත ඇය සමග සංවාසයේ යෙදුන විට මානසික ලෙස ද පසුකාලීන ව විකෘතිතා නිර්මාණය වීමේ අවධානමක් පවතී. මෙම ක්‍රියාකලාපය ළමයෙකුගේ පෞරුෂය සංවර්ධනය සඳහා ප්‍රබල ව බලපෑ හැකි ය. එසේ ම ළමයකුට මෙවැනි ලිංගික අපයෝජනයක් සිදු වූ විට ඇයට එය අධිකරණය ඉදිරියේ විස්තර කිරීමේ දී පවා ලංකා සංස්කෘතියට අනුව බරපතල ගැටලුවකි. ශ්‍රී ලාංකේය සංස්කෘතියට අනුව විවාහයට පෙර පූර්ව වෛවාහක ලිංගික සබඳතා පැවැත්වීමට කාන්තාවන්ට අවස්ථාව ලබා නොදේ. මීට හේතුව වන්නේ කන්‍යාභාවය සම්බන්ධයෙන් ලංකාවේ පවතින සංස්කෘතික ප්‍රතිමාණය යි. නමුත් මෙම ළමයා තමාගේ කුඩා කාලයේ දී ම එය නැතිකර ගෙන තිබීම මත ඇයට අනාගත ජීවිතය සම්බන්ධ විශාල ප්‍රශ්න රාශියකට මුහුණ දීමට සිදු වේ. ජයරානිගේ ප්‍රත්‍යෙක අධ්‍යයනය තුළ දී ඇය ලිංගික ශ්‍රමිකයෙක් බවට පත්වීමට ප්‍රධාන වශයෙන් කාරණා කිහිපයක් බලපා ඇති බව පෙනේ. ප්‍රත්‍යෙක අධ්‍යයනය ගැඹුරින් පිරික්සීමේ දී එම කාරණා හොඳින් මතු කර ගත හැකි අතර ඒවා පහත පරිදි දැක්විය හැකි ය. එනම්,

1. පළමු පවුල් ඒකකය තුළ මවගේ අහිමි වීම.
2. පළමු පවුල් ඒකකය තුළ අන්තර් සබඳතා බිඳවැටීම

3. පිය පවුල තුළ දරුවන්ට සැලකීමේ විභේදතා නිර්මාණය වීම
4. පළමු පවුල් ඒකකයේ සිට නව පවුල් ඒකකයට පරිවර්තනය වීම.
5. ගෘහිය කටයුතු හා වෙළඳාමට හුරුපුරුදු වීම
6. ළමයා නිවස තුළ හුදකලාවීම හා වැඩිහිටි පිරිමියාගේ ලිංගික කාර්යය
7. තර්ජනය කිරීම හා ලිංගික අපයෝජනය
8. තැරැව්කරුවන්ගේ වෙළඳ භාණ්ඩයක් වීම යන කාරණා මුල් වී ඇති බව පෙනේ.

මෙලෙස ආර්ථික වශයෙන් ළමුන් නොයෙකුත් ගැටලුවලට මුහුණ දෙන අතර ළමා ශ්‍රමිකයෙකු වීම තුළින් ළමයා සමාජ හා අධ්‍යාත්මික වශයෙන් ද ගැටලුවලට මුහුණදීම සුවිශේෂී වේ. අධ්‍යයන නියැදිය පරීක්ෂා කර බලන කල්හි ළමා ලිංගික ශ්‍රමිකයන් මුහුණ දෙන සමාජ ගැටලු කිහිපයක් වේ. එනම්,

1. පාසල් අධ්‍යාපනය අහිමි වීම
2. අඩු වයසින් පාසල් හැරයාම
3. කිසිඳු අධ්‍යාපනයක් නො ලැබීම නිසා අනාගත ජීවිතය ගොඩනගා ගැනීම පිළිබඳ ගැටලු මතුවීම
4. මත්ද්‍රව්‍යවලට හා අපචාරවලට යොමුවීම
   (උදා: ගංජාවලට ඇබ්බැහිවීම, මත්ද්‍රව්‍ය හා මත්කුඩුවලට ඇබ්බැහි වීම, සොරකම්වලට පෙළඹීම)
5. සමාජයෙන් කොන්වීම
6. සුදු ක්‍රීඩාවන්වලට ඇබ්බැහි වීම (උදා:- රේස් දැමීම, බූරුවා ගැසීම)

## ළමා ශ්‍රමය පවුල් ඒකකයේ ආර්ථික අංශයට කරන ධනාත්මක බලපෑම

පවුලේ බලපෑම මත ළමයා ශ්‍රමිකයකු බවට පත්වුව ද ඔහු තුළින් දැකගත හැකිවූයේ ඍණාත්මක සාධකයන් ය. නමුත් පවුලේ ආර්ථිකය පවත්වා ගෙන යාමට වැඩිහිටියන්ට නො හැකි වූ හෝ හැකියාව තිබුණත් ඊට කාර්යයක්ෂමව උර නොදෙන තත්ත්වයක් තුළ ළමයින්ගේ සක්‍රීය දායකත්වය මත පවුල් ආර්ථිකය ශක්තිමත් විය හැකි ය. අධ්‍යයන ප්‍රදේශය තුළ ළමා ලිංගික ශ්‍රමිකයන් තමාගේ ශ්‍රමය සැපයීම තුළින් ආර්ථික වශයෙන් ශක්තිමත්භාවයක් ඇති කරගත් බව අනාවරණය විය. ඒ අනුව ආර්ථික වශයෙන් පවුල් ඒකකයට ලැබුණු ධනාත්මක බලපෑම පහත පරිදි දැක්විය හැකි ය.

1. භෞතික වත්කම් ප්‍රමාණය ඉහළ යාම
   මෙහිදී ළමා ලිංගික ශ්‍රමිකයන්ගේ අපේක්ෂාව වුයේ සෙලියුලර් දුරකථන මිල දී ගැනීම, නිවෙස් අලුත්වැඩියා කර ගැනීම, නව නිවෙස් ඉදිකර ගැනීම, නිවසට අවශ්‍ය විදුලි උපකරණ හා ගෘහභාණ්ඩ මිල දී ගැනීම, රත්රන් ආභරණ මිල දී ගැනීම, වාහන මිල දී ගැනීම උදා:- මෝටර් සයිකල්, යතුරුපැදි යන කාරණාය.
2. ඉතිරිකිරීම් හා ආයෝජනයන්ට හුරුපුරුදු වීම
   අධ්‍යයන දත්තයන්ට අනුව ළමා ලිංගික ශ්‍රමිකයන් සීට්ටු ක්‍රමයන් ඇතිකර ගැනීම, පෞද්ගලික බැංකු ගිණුම් පවත්වාගෙන යාම, මුදල් පොලියට ලබාදීම හා කැට ක්‍රමයන් පවත්වා ගෙන යාම සිදුකරන ලදී.
3. පවුල් ආර්ථිකය ශක්තිමත් වීම
4. නවීන විලාසිතාවන්ට පෙළඹීම
5. වෙළඳ ව්‍යාපාර මිල දී ගැනීම

ඉහත සාධකයන් පරීක්ෂා කර බලන කල්හි අනාවරණය වන්නේ ළමයාට පෞද්ගලික ව ආර්ථික වශයෙන් වාසි සහගත තත්ත්වයක් මෙන් ම සමස්තයක් ලෙස පවුල් ඒකකයට ධනාත්මක බලපෑමක් ඇතිකරන බවකි. විශේෂයෙන් ම නූතන ආර්ථික රටාවන් හා සාපේක්ෂ ව ළමයින්ගේ ද ආර්ථික රටාවන් ද එකිනෙකට අනුයාත වී ඇති බව පෙනේ.

## ලිංගික ළමා ශ්‍රමිකයින්ගේ අනාගත බලාපොරොත්තු

අධ්‍යයන නියැදිය පොදුවේ පරීක්‍ෂා කර බලන කල්හි ළමා ශ්‍රමිකයන් සියලුදෙනාගේ ම අනාගත අපේක්‍ෂාවන් (Aspirations) නූතන සමාජයට ගැළපෙන ලෙස හැඩ ගැසී තිබුණි. මෙම සෑම කරුණකින් ම ළමුන් අනාගතයේ තම සමාජ තත්ත්වයන් ප්‍රදර්ශනය කිරීමට කටයුතු කරන බව පෙනේ. මෙම කාරණා පහත පරිදි දැක්විය හැකි ය. ඒවානම්,

1. නවීන පන්නයේ සුඛෝපභෝගී වාහනයක් මිල දී ගැනීම
2. නව වෙළඳ ව්‍යාපාර ආරම්භ කිරීම
3. දේශපාලනයට අවතීර්ණ වීම
4. නව නිවසක් ඉදිකර ගැනීම
5. තම බාල සහෝදර සහෝදරියන්ගේ අධ්‍යාපනය ඉහළ නැංවීම

කලින් සඳහන් කල පරිදි ළමුන්ගේ අනාගත බලාපොරොත්තු පිළිබඳ ව පරීක්‍ෂා කර බලන විට පෙනී යන්නේ සෑම ළමයෙකු ම තම භෞතික වත්කම් ප්‍රමාණය ඉහළ නංවා ගැනීමට කටයුතු කර ඇති බව යි. විශේෂයෙන් ම සමාජ ස්ථරායනයේ සාධිත තත්ත්වය ආරෝපනය කරගැනීමට ළමුන් කටයුතු කරන බව පෙනේ. අනෙක් අතට සමාජය තුළ ආර්ථික වත්කම් වැඩි කරගැනීම හරහා උඩුකුරු චල්‍යතාවයකට ප්‍රවේශය ලබා ගන්නා බව පෙනේ. අධ්‍යයන නියැදියේ අනාගත බලාපොරොත්තු සම්බන්ධ ව බලන කල්හි වඩාත් ප්‍රමුඛ වී ඇත්තේ සුඛෝපභෝගී වාහනයක් මිල දී ගැනීම, ධීවර බෝට්ටු හිමිකරුවකු වීම, විශාල ව්‍යාපාරිකයකු වීම හා නව නිවසක් ඉදිකර ගැනීම යන කාරණා ය. මෙම සියලු කාරණා ලිංගික ළමා ශ්‍රමිකයා නව ලිබරල්වාදී ආකෘතික රටාවටකට හුරුවීම සඳහා දක්වන රුචිකත්වයක් ලෙස දැක්විය හැකිය.

**නිගමනය**

අධ්‍යයන නියැදියට අදාළ දත්ත පිළිබඳ ව පරීක්‍ෂා කිරීමේ දී ළමා ලිංගික ශ්‍රමිකයකු බිහි කිරීම සඳහා පවුල් ඒකකය ඍජු බලපෑමක් සිදු කර ඇති බව පෙනේ. පවුල තුළ පවතින සහසම්බන්ධතා රටාව බිඳ වැටීම, පවුල තුළ ගැටුම්කාරී බව, ළමුන් සඳහා නිසි රැකවරණය නොමැති වීම, දෙමාපියන්ගේ අකාර්යක්‍ෂම පාලනය, තුන්වන පාර්ශවයකගේ බලපෑම, පියා මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වීම යන බහුවිධ කාරණා ළමයෙක් ලිංගික ශ්‍රමිකයකු බවට පත් කිරීමට හේතු වී ඇති බව අධ්‍යයනය පරීක්‍ෂා කිරීමේ දී අනාවරණය විය. විශේෂයෙන් ම දෙමාපියන් පවුල විෂයෙහි ඍජුදායකත්වයක් නොදැක්වීම හා ළමුන් ජීව විද්‍යාත්මකව උත්පාදනය කරන්නන් බවට පත් කිරීම විනා ඔවුන්ට ලබාදිය යුතු ආර්ථික, සමාජීය හා අධ්‍යාපනික යන වරප්‍රසාදයන් ලබා දීමට පෙළඹී නැති බව අධ්‍යයනය තුළින් නිගමනය කල හැකි කාරණයන් වේ. එසේම අධ්‍යාපනය ලැබීමට ඇතැම් ළමුන්ට අවශ්‍යතාවය පැවතියත්, ඒ සඳහා යහපත් පරිසරයක් පවුල් ඒකකය තුළ නිර්මාණය වී නොමැත. පියා රැකියාවක නිරත වුවත්, ඔහු උපයන මුදල පවුල් ඒකකය නඩත්තු කිරීම සඳහා ප්‍රමාණවත් නොවීම තුළම පියා පවුල විෂයෙහි කළ යුතු කාර්යයභාරයන්ගෙන් ඉවත් වී යාමත් සිදු වී ඇත. පියා පවුල තුළට ආර්ථික වශයෙන් ශක්තිමත් ස්ථාවරත්වයක් සැපයුවේ නම් ළමයෙක් මෙලෙස ළමා ලිංගික ශ්‍රමිකයෙක් නොවීමට ඉඩකඩ පැවතියේ ය.

ලාංකීය පවුල් සංස්ථාව තුළ විවාහයට පෙර පූර්ව වෛවාහක ලිංගික සබඳතා පැවැත්වීමට අවස්ථාව නොදෙයි. එයට හේතුව කන්‍යාභාවය පිළිබඳ ව පවතින විශ්වාසය යි. නමුත් ළමා ලිංගික වෘත්තිකයන් ලෙස යොදා ගනු ලබන ගැහැණු ළමුන්ට තමාගේ කන්‍යාභාවය, වැඩිවියට පැමිණීමත් සමගම විනාශ කර ගැනීමට සිදු වී ඇත. මේ තත්ත්වය නිසා අනාගතයේ දී ඇයට විවාහ වීමට පවතින අවස්ථා ද මඟ හැරී යයි. ලිංගික ජීවිතය පිළිබඳ ව කිසිදු අත්දැකීමක් නොමැති මෙම ළමුන්ට අධික කාමාශාවන් ඇති පුද්ගලයන්ගේ වෙළඳ භාණ්ඩයක් බවට පත් වීමට සිදු වී ඇත. එම නිසා සමාජයේ මොවුන් ලේබල්කරණයට ලක් වීමක් සිදු වේ.

අධ්‍යාත්මික අංශය පෝෂණය කිරීමෙහිලා පවුලෙන් විශාල කාර්යයභාරයක් සිදු විය යුතුය. එනම් පවුල තුළ පවතින සංස්කෘතික ප්‍රතිමාන, අභ්‍යන්තරීකරණය, වැඩිහිටියන් සමග සබඳතා ගොඩනගා ගන්නා ආකාරය ආදි වශයෙන් දරුවන් තුළ අභ්‍යන්තරීකරණය කිරීමට පවුල දායක විය යුතුය. නමුත් ප්‍රත්‍යෙක අධ්‍යයනයන් පරීක්ෂා කර බලන කල්හි පෙනී යන්නේ එම අංශය සංවර්ධනය කිරීම සඳහා පවුලේ දායකත්වයක් ලබා දී නොමැති බවයි. මෙම කාර්යාවලිය පවුල තුළින් ඉවත් වී ගොස් ඇති නිසා ම ළමයා සමාජය තුළ අපචාරි පුද්ගලයකු බවට පත් වී ඇත. එනම් සොරකම් කිරීම, වැඩිහිටියන්ට ගරු නොකිරීම, මත්පැනට  ඇබ්බැහිවීම, මත්ද්‍රව්‍ය භාවිතය, සූදුව වැනි අපචාරි ක්‍රියාවලට ළමයා පෙළඹී ඇත. පවුල් ඒකකය ළමයාගේ අධ්‍යාත්මික සංවර්ධනය සඳහා මැදිහත්වීමක් සිදු වූයේ නම් ඉහත දුෂ්කෘත්‍යයන්ගෙන් ළමයා මුදවා ගැනීමට හැකියාව තිබුණි. ආකල්පමය වශයෙන් ළමයා තුළ යහපත් ආකල්පමය රටාවක් ඇති කළේ නම් මෙවැනි වැරදි ක්‍රියාවන්ගෙන් ළමයා මුදවා ගැනීමට හැකියාව පැවති බව දක්විය හැකි ය. එම නිසා පවුලේ කාර්යයභාරයේ දී දෙමාපියන්ගේ දායකත්වය ළමයා විෂයෙහි යහපත් අයුරින් බලපැවැත් වී නොමැති බව නිගමනය කළ හැකි ය.

තවදුරටත් පැහැදිළි කළ විට අධ්‍යයන දත්ත මගින් පෙනී යන තවත් ප්‍රධාන කරුණක් නම් දෙමාපියන්ගේ නුගත්කම ද ළමයා ලිංගික ශ්‍රමිකයකු බවට පත් කිරීමට හේතුවක් වී ඇත. ළමයාට අධ්‍යාපනය ලබා දීම තුළින් පවුලට වන වාසිදායක තත්ත්වය පිළිබඳ ව දෙමාපියන් සියලුදෙනාට ම අවබෝධයක් නොමැති බව නිගමනය කළහැකි ය. අධ්‍යාපනය ලබා දීමට වඩා මූල්‍ය අංශයට ළමයා යොමු කරවීමක් සිදු වී ඇත. මේ නිසා අධ්‍යාපනයෙන් ඉවත් වීම නිසා ළමයාගේ විකල්ප අවස්ථාව වී ඇත්තේ ශ්‍රමදායකයකු බවට පත් වීමයි. මේ සඳහා ප්‍රධාන වශයෙන් දෙමාපියන්ගේ හා වැඩිහිටියන්ගේ අනාරක්ෂිත ක්‍රියා කලාපය හේතු වී ඇති බව නිගමනය කළ හැකිය.

**යෝජනා**

1. පවුල් ඒකකය තුළ සංස්කෘතික ප්‍රතිමාන හා සහසම්බන්ධතා රටාව ශක්තිමත් කිරීම සඳහා පවුලේ සමාජිකයන් එක්ව කටයුතු කිරීම
2. ළමා කාලය තුළ ළමයෙකුට ලැබිය යුතු රැකවරණය හා ආරක්ෂාව, පෝෂණය පවුල් ඒකකයෙන් නිසි පරිදි ලබාදීම
3. ළමයෙකුට සාධිත තත්ත්වය ගොඩනඟා ගැනීමට අවශ්‍ය කරන පරිසර රටාව පවුල් ඒකකය තුළින් නිර්මාණය කරදීම සඳහා දෙමාපිය මැදිහත්වීම සක්‍රීයව ලබාදීම
4. සමාජමය වශයෙන් ආන්තීකරණයට ලක්වන මෙම ළමා ලිංගික ශ්‍රමිකයන් සඳහා අවශ්‍යකරන සමාජීය රැකවරණය පවුල් ඒකකය තුළ ශක්තිමත් කිරීම

**ආශ්‍රිත ග්‍රන්ථ**


කරුණාතිස්ස, එස්.ඒ., රූපසිංහ ටී.ජී., 1982 ඔක්තෝබර්/ නොවැම්බර්. 'ග්‍රාමීය අංශයේ ළමා ශ්‍රමය සූරා කෑම'. *ආර්ථික විමසුම.* කොළඹ :පර්යේෂණ අංශය, මහජන බැංකුව.

කුරේ, නිරංජන්. 2005.*ශ්‍රී ලංකාවේ සිදු වන ළමා අපයෝජන.* කළුතර : ශ්‍රීමතී මුද්‍රණාලය.

Amarasigha, Sarath. Feb 2002. *The Commercial Sexual Exploitation of Childern: A Rapid Assessment*.Geneva: International Labor Office.

Challis,J. & Elliman, D., 1996.*Child Workers Today*. London: Anti - Savory Society.

Chaudhury,Debadutta&Tripathy.S.N., 2005.*Girl Child and Human Rights*. New Delhi: Anmol Publication.

*Child Labor: A Text Book for University Students*. 2004. Geneva: International Labor Office.

Kannan, C.P., 2001.*Economics of Child labor*. New Delhi: Deep and Deep Publication.

Shibani, Dasgupta. 1997. *Child Labor in India and the World*. New Delhi: Monty Public Opinion Surveys.

Sutherland E.H., 1974.*Criminology* (9th ed). New York: J.B. Lippincott Company.